ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2006 අංක 52 දරන ජපන් ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2006** දෙසැම්බර් මස **15** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2006 අංක 52 දරන ජපන් ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී. ඕ.— අයි.එන්.සී 11/2003

### ජපන් ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

ජපන් ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1**. මේ පනත 2006 අංක 52 දරන ජපන් - ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජපන් - ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය සංස්ථාගත කිරීම.

**2**. මේ පනත ආරම්භවන දින සිට හා ඉන්පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජපන් - ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමයෙහි සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජපන් - ශ්‍රී ලංකා අධ්‍යාපනික හා සංස්කෘතික සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නමින් සංස්ථාව විසින් ද, සංස්ථාවට විරුද්ධව ද නඩු පැවරිය හැකි වන්නේ ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) විදේශ භාෂා ඉගැන්වීම සඳහා පාඨමාලා පැවැත්වීම සහ එවැනි අධ්‍යයන සඳහා උසස් අධ්‍යාපන සහ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම ;

(ආ) විදේශිකයන් සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා පාඨමාලා පැවැත්වීම ;

(ඇ) පවත්වන පාඨමාලා සාර්ථකව හදාරා අවසන් කල සිසුනට ප්‍රවීනතා සහතික පිරිනැමීම ;

(ඈ) උචිත පාඨමාලා හදාරනු ලබන සිසුන් ඒ ඒ විදේශ භාෂා සම්බන්ධව අදාළ පාඨමාලා පවත්වන විභාගවලට පෙනීසිටීමට සැලැස්වීම;

(ඉ) සියලුම පාඨමාලාවන්, සුදුසුකම් ලද ප්‍රවීන ආචාර්ය මණ්ඩලයක් යටතේ පැවැත්වීම හා සියලුම භාෂා පාඨමාලාවන්ගේ විෂය නිර්දේශයන් 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය මගින් සකස් කර ගැනීම ;

(ඊ) වෘත්තීය පුහුණු, අධ්‍යාපන සහ සමාජ සේවා යන විෂය භාර අමාත්‍යවරුන්ගේ අදාළ අමාත්‍යාංශවල අනුමතය ඇතිව ඉගෙනීම සඳහා විශේෂ හැකියාව ඇති සිසුන් තෝරා ගැනීම ;

(උ) පුස්තකාළ පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, ලියකියවිලි, සඟරා, සමරුකළාප, වාර සඟරා ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සහ යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම ;

(ඌ) දේශණ, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පංති, සමූහ අධ්‍යයන, විනෝද චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම හා පැවැත්වීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම් හෝ සංවිධාන සමඟ සහයෝගී වීම සහ සහචර්ය වීම ; සහ

(ඒ) යම් දේශීය හෝ විදේශීය තාක්ෂණික හෝ වෘත්තීය අභ්‍යාස ආයතනයක, අනුබද්ධ ආයතනයක් ලෙස හෝ සංවිධානයක නියෝජිතයකු ලෙස ක්‍රියා කිරීම සහ විදේශීය රටවල් සමග සංස්කෘතික හුවමාරු වැඩ සටහන් ආදිය දියත් කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය

නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය, කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, ඉටුකිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**5**. (1) සංස්ථාවේ කළමනාකරණ කටයුතු, අනුශාසක, සභාපති, ලේකම්, උපලේකම් සහ භාණ්ඩාගාරික ඇතුළුව සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන දසදෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින්, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද තකාෂි දොෂිනා මහතා සහ මසනොරි තොයෝද මහතා සංස්ථාවේ යාවජීව අනුශාසකවරුන් විය යුතු අතර, ඔවුන්ගෙන් පසුව අනුශාසක ධුරයට ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ඔවුන් විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන පුද්ගලයන් ද යාවජීව අනුශාසකවරුන් වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම සභාපති, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ සභාපති ධුරය දරන්නා විය යුතු ය.

**6**. (1) සංස්ථාව විසින් යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඈ) සංස්ථාවට නිලධරයන් පත්කිරීම, පහ කිරීම හා සේවා කොන්දේසි සහ ඔවුන්ගේ කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ සේවකයන් විසින් අනුගමනය කළ යුතු චර්යා සංග්‍රහය ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත් වන්නේ ය.

(3) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

**7**. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පැවැති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල්, මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**8**. සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ අරමුදල්.

**9**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවිය යුතු ය.

**10**. (1) සංස්ථාවට ලැබුණ සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

ගිණුම් හා විගණනය.

(2) සුදුසුකම් ලත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වන විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකට ම වරක් පරීක්ෂා කොට විගණනය කර සහතික කරනු ලැබිය යුතු ය.

**11**. යම් මිලට ගැනීමකින්, දායක මුදලකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තවද, එවැනි සියලුම දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**12**. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.